# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 28 දරන වෛද්‍ය අවශ්‍යතා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අගෝස්තු මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 අගෝස්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 28 දරන වෛද්‍ය අවශ්‍යතා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අගෝස්තු මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 21/72

වෛද්‍ය අවශ්‍යතා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 28 දරන වෛද්‍ය අවශ්‍යතා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. වෛද්‍ය අවශ්‍යතා ආඥාපනතේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— — 226 වන අධිකාරයේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අධිකාරී විසින් ගෙවිය යුතු ගාස්තු.

10. මේ ආඥාපනත යටතේ සපයනු ලබන වෛද්‍ය සේවාවන් සඳහා අධිකාරීවරුන් විසින් පහත සඳහන් මුදල් ගණන් ගෙවිය යුතුය :—

(අ) රෝගීව සිටින කම්කරුවකුට හෝ කම්කරුවන්ට ප්‍රතිකාර කිරීමේ කාර්යය සඳහා වත්තකට යන සෑම ගමනක්ම වෙනුවෙන් රුපියල් පහක් ;

(ආ) රෝගීව සිටින ආගාමික කම්කරුවකු රෝහලක නවත්තු කිරීම වෙනුවෙන්, එසේ නවත්තු කරන කාල සීමාවේ එක් එක් දිනය හෝ දිනයකින් ගත නොවී ඇති කොටස සඳහා, නැතහොත් එසේ නවත්තු කරන සම්පූර්ණ කාල සීමාව එක් දිනකට අඩු නම් එම කාල සීමාව සඳහා, රුපියල් තුනකුත් සත පණහක් හෝ කලින් කල නියම කරනු ලැබිය හැකි වෙනත් යම් මුදල් ගණනක් :

එසේ වුව ද—

(i) ඒ කාල සීමාව එක් දිනකට වැඩි වන්නේ නම්, කම්කරුවා මධ්‍යාහ්න යට පෙර රෝහලෙන් පිටව යනහොත් පිටව යන දිනය වෙනුවෙන් (ආ) ඡේදය යටතේ කිසිම මුදලක් නොගෙවිය යුතුය ; තවද

(ii) එම ඡේදය යටතේ ගෙවීමට බැඳී සිටීම දින හැටක කාල සීමාවකට පසු නොතිබිය යුතුය.".

2—ඒ 08269--11,350 (74/07)